## චීන ප්‍රදාන ආධාර ව්‍යාපෘතිය - 2012

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ප්‍රදාන ආධාර ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

#### 2.1 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘති වියදම රු. 1,349,990 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 151,110,295 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම, පසුගිය වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012<br>රු. | 2011<br>රු. | රු. |
| ජංගම නොවන වත්කම් | (21,159)* | (102,406) | 641,338 |
| කෙරීගෙන යන වැඩ | 1,371,149 | 35,989,485 | 150,468,957 |
| | 1,349,990 | 35,887,079 | 151,110,295 |

* සමාලෝචිත වර්ෂයේ වත්කම්වල ක්ෂයවීම රු. 21,159

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(1) රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් කුලී තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව ව්‍යාපෘති කාර්යාල ගොඩනැගිලි කුලී වශයෙන් රු.360,000 ක් ගෙවා තිබුණි.

(2) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද 8.13.4 අනුව සැලසුම් වෙනස්කිරීමට හේතු අදාල පාර්ශවයන් විසින් පැහැදිලි කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල වීමෙන් තොරව රු.3,025,266 ක් අතිරේක වැඩ සඳහා ගෙවා තිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අරමුදල් උපයෝජනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා මහජන චීන සමූහාණ්ඩුව අතර 2005 අගෝස්තු 30 දින අත්සන් කල ගිවිසුම අනුව රු. මිලියන 720 ක ප්‍රදානයක් දී තිබුණු අතර එය සෘජුව චීන රජය විසින් මෙහෙයවන ලදී. රජයේ දායකත්වය පදනම් කරගෙන ගිණුම් පිළියෙල කර ඇත.

මූල්‍ය වාර්තා හා ඉදිරිපත් කර ඇති තොරතුරු මත සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2012.01.01 රජයේ දායකත්වය | 151,388,789 |
| 2012 වර්ෂයේ අරමුදල් ලැබීම | 517,015 |
| චීන කොන්ත්‍රාත්කරු විසින් ආපසු ගෙවූ රේගු බදු | (795,509) |
| 2012 දෙසැම්බර් 31 දිනට රජයේ දායකත්වය | 151,110,295 |

### 4.2 භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පහත දැක්වේ.

| කාර්යය | 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු අගය<br>රු. මිලියන | 2012 දෙසැම්බර් 31 දිනට සිදුකළ තථ්‍ය වියදම<br>රු. මිලියන | 2012 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය |
| (අ) වැලිකඩ මංසන්ධියේ රථ වාහන සංඥා පද්ධතිය සවිකිරීම<br>(ආ) කිරිබත්ගොඩ - කඩවත මාර්ග කොටස වැඩිදියුණු කිරීම (කි.මී 2.3) | 150 | 150 | 100% |
| (ඇ) ප්‍රවේශ මාර්ග 32 නැවත සකස් කිරීම | 14.6 | 10.8 | 100% |

2009 මාර්තුවල වැලිකඩ මංසන්ධියේ රථ වාහන සංඥා පද්ධතිය සම්පූර්ණ කොට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී ඇතත් මාර්ග කොටස පළල් කිරීම සඳහා එය 2012 ඉවත්කරන ලදී. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සංඥා කණු හා උපාංග නැවත ස්ථාපිත කිරීම සිදුනොකර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.